## වෛද්‍ය විද්‍යාවේ දියුණුව

01. එංගලන්ත ජාතික විලියම් නාවේ

රුධිර සංසරණ පද්ධතිය පිළිබඳ අදහස් ඉදිරිපත් කරන ලදී

02. ස්විස්ටර්ලන්ත ජාතික වෛද්‍ය පැරසල්සස්

ලෙඩරෝග සෑදීමට තුඩුදෙන හේතු සහ ඒවාට ප්‍රතිකර්ම අත්හදා බැලීම. නූතන රෝග චිකිත්සක ක්‍රම කෙරෙහි විශාල බලපෑමක් ඇති කරන ලදී.

03. ස්විස්ටර්ලන්ත ජාතික මයිකල් සර්ටෙස්

රුධිරය හදවතේ දකුණු කෝෂිකාවෙන් පිටව ගොස් පෙනහළුවලදී පිරිසිදු කර නැවත හාදයට පැමිණ ශරීරය පුරා බෙදා හැරීම.

## මුද්‍රණ කර්මාන්තය

1454 දී ජොහැන්නස් ගුටෙන්බර්ග් විසින් මුද්‍රණ යන්ත්‍රය නිපදවීම මුද්‍රණ කර්මාන්තයේ දියුනුවට හේතුවිය.

## දේශපාලන නවෝදය

01.ජාතික රාජ්‍යයන් බිහිවීම

මධ්‍යතන යුගයේදී වෙන වෙන්ව ප්‍රාදේශීය පාලන ඒකක ලෙස තිබූ පාලනය අවසන් කරඑම කුඩා රාජ්‍යයන් එක් කොට එක් පාලකයකුගේ පාගනයට යටත් වූ රාජ්‍යයන් බිහි කරන ලදී. එම රාජ්‍යයන් ජාතික රාජ්‍යන් ලෙස හැදිනවේ.

02. මධ්‍යම පන්තියට දේශපාලන බලය හිමි වීම

පුනරුද සමයේදී වෙළදාමෙන් මුදල් උපයා ගත් පිරිසක් ධනවතුන් ලෙෂ සමාජයේ කැපී පෙනෙන්නට විය. ඔවුන් මධ්‍යම පන්තිය ලෙෂ හදුන්වන ලදී. මෙම පන්තියට වෙළෙන්දන්, බැංකු කරුවන්, නැව් හිමියන්, තවලම් හිමියන් අයත් විය. සමාජය තුළ මෙම පිරිස කැපී පෙනෙන ඉඩම් හිමි වංශාධිපතිවරුන්ගේ බලය සහ අයිතිවාසකම් ගිලිහෙන්නට විය. එම බලතල මධ්‍යම පන්තියට හිමි විය.

## ආර්ථික නවෝදය

01. ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමය බිඳවැටීම. වාණිජ ආර්ථිකයක් බිහිවීම.

02. මුදල් භාවිතය ප්‍රචලිත වීම.

03. වෙළඳ කටයුතු වලට රාජ්‍ය අනුග්‍රහය සෘජුව ලැබීම.

04. යුරෝපා රටවල් වෙළඳ සහ බදු ප්‍රතිපත්ති සකස් කිරීම.

05. දේශගවේෂණය හේතුවෙන් විදේශ වෙළඳාම දියුණු වීම.

06. ආරක්ෂිතව මුදලි ගණුදෙණු කිරීම සඳහා චෙක්පත් හා බැංකු අණාකර භාවිතය.

07. මුදල් ගණුදෙණු කිරීම සඳහා බැංකු මගින් සිදු කිරීම.

## නව වෙළඳ මාර්ග සොයා ගැනීම

1453 දී කොන්සිතන්තිනොපත් නගරය තුර්කීන් විසින් අල්ලා ගැනීමත් සමග යුරෝපා ජාතින්ට ආසියාවට පැමිණීමට තිබූ සාම්ප්‍රදායික මාර්ග අවහිර විය. එනිසා නව මාර්ග සෙවීම යුරෝපීයන් උනන්දු විය.

## යුරෝපා ජාතීන්ට නව වෙළඳ මාර්ග සොයා ගැනීමට උපකාරී වූ සාධක

01. මාලිමා යන්ත්‍රය හා උතුරු තරු මාපකය නිපදවීම

02. ලෝකය ගෝලාකාර බව ඔප්පු කිරීම

03. ක්ලෝඩියස් ටොලමි විසින් අඳින ලද ලෝක සිතියම

04. රාජ්‍ය අනුග්‍රහය ලැබීම

උදා ඃ- පෘතුගාලයේ හෙන්ඩ්‍රි කුමරු

ස්පාඤ්ඤයේ ෆර්ඩිනන් හා ඉසබෙලා රැජිණ

## සොයාගත් නව වෙළඳ මාර්ග සහ රටවල්

මුලින්ම දේශගවේශන ව්‍යාපාරයේ නිරත වූයේ පෘතුගාලය හා ස්පාඤ්ඤයයි.

බර්තොලමි ඩයස් ආසියාවට පැමිණීමේ අරමුණින් මුහුදු මාර්ග ඔස්සේ පැමිණියද අප්‍රිකාවේ කුනාටු තුඩුව අසල කුනාටුවකට හසුවීම නිසා නැවත මව් රට බලා යන ලදී.

බර්තොලමි ඩයස්ගේ ගමන් මාර්ගය ඔස්සේ පැමිණ වස්කොද ගාම ක්‍රි.ව.1498 දී ඉන්දියාවට පැමිණීම. එහිදී ඉන්දියවේ කැලිකට් වලට ගොඩ බසින ලදී.

දේශ ගවේශන ව්‍යාපාරය යටතේ ආසියාවට පැමිණි ප්‍රථම යුරෝපා ජාතිකයා වූයේ වස්කෝද ගාමා ය.

ඉන්පසුව විවිධ රටවල විවිධ පුද්ගලයන් විසින් පහත සොයාගැනීම් සිදුකරන ලදී.

| පුද්ගලයා | සොයාගත් රට හෝ ප්‍රදේශය |
|---|---|
| ක්‍රිස්ටෝපර් කොලොම්බස් | බටහිර ඉන්දීය දූපත් |
| ඇමරිගෝ වෙස්පුෂි | ඇමරිකාව (නව ලෝකය) |
| කැබේ සහෝදරයෝ | කැනඩාව |
| ෆර්ඩිනන් මැගලන් | පිලිපීනය හා මැගලන් සමුද්‍ර |

## පුනරුදයේ ගෝලීය ප්‍රවණතා

දේශ ගවේශන ව්‍යාපාරය හරහා පුනරුදයේ විවිධ ගුණාංග ලොව පුරා ව්‍යාප්ත විය. එය පුනරුදයේ ගෝලීය ප්‍රවණතා ලෙස හැඳින්වේ.

01. යටත් විජිත ඇතිවීම

02. කතෝලික දහම ලොව පුරා ව්‍යාප්ත වීම

03. වෙළඳාම පමනක් නොව යුරෝපයේ සමාජ සංස්කෘතික ආදී සාධකද ව්‍යාප්ත වීම

04. මුද්‍රණ කර්මාන්තය ලොව පුරා ව්‍යාප්ත වීම නිසා අධ්‍යාපනික දියුනුවක් ඇතිවීම.

05. ආගමික ගොඩනැගිලි හරහා යුරෝපීය වාස්තු විද්‍යාව ව්‍යාප්ත වීම

පෘතුග්‍රීසීන් හා ලන්දේසීන් මුහුදුබඩ ප්‍රදේශත් ඉංග්‍රීසීන් ශ්‍රී ලංකාව පූර්ණ වශයෙනුත් යටත් කරගෙන සිටීම නිසා පුනරුදයේ බලපෑම සෘජුවම ශ්‍රී ලංකාවට ලැබුනි. එය ප්‍රධාන අංශ 3ක් ඔස්සේ අධ්‍යනය කල හැක.

1. දේශපාලන වෙනස්කම්

2. ආර්ථික වෙනස්කම්

3. සමාජ සංස්කෘතික වෙනස්කම්

<u>**දේශපාලන වෙනස්කම්**</u>

- රාජාණ්ඩු ක්‍රමය අවසන් කර පාර්ලිමේන්තු ක්‍රමයක් හදුන්වා දීම
- සම්ප්‍රදායික නිලධාරීන් වෙනුවට නව පාලන ආයතන පද්ධතියක් හදුන්වා දීම
- රෝම ලව්දේසි නිතිය ක්‍රියාත්මක කිරීම
- නව අධිකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම

<u>**ආර්ථික වෙනස්කම්**</u>

- ස්වයං පෝෂිත ආර්ථිකය බිඳ දමා වාණිජ ආර්තිකයක් ඇති කිරීම
- වාණිජ බෝග වගා කිරීම
- ආනයන අපනයන ක්‍රමයක් බිහිවීම
- මුදල් භාවිතය ප්‍රචලිත වීම
- කොළඹ, ගාල්ල, ත්‍රිකුණාමලය වැනි වෙළඳ නගර බිහි වීම
- උගත් මධ්‍යම පන්තියක් බිහිවීම

<u>**සමාජ සංස්කෘතික වෙනස්කම්**</u>

- මුද්‍රණ කර්මාන්තය හදුන්වා දීමත් සමග අධික ලෙස පොත් පත් මුද්‍රනය වීම
- එනිසා යුරෝපා චින්තනය හා සාහිත්‍ය මෙරට තුළ ව්‍යාප්ත වීම
- බටහිර අධ්‍යාපනය මෙරටට ලැබීම
- යුරෝපයේ වාස්තු විද්‍යාව මෙරටට ලැබීම
- 1517 යුරෝපයේ ආගමික විප්ලවයේ ප්‍රථිපලයක් ලෙස යුරෝපය තුළ ක්‍රිස්තියානි ආගමේ එක්සත් බව බිඳවැටීම නිසා පෘතුග්‍රීසීන් රෝමානු කතෝලික ආගමත් ලන්දේසීන් රෙපරමාදු නිකායත් මෙරටට ගෙන ඒම.
- විවිධ ඇඳුම් පැළදුම් ආහාරපාන උපකරණ මෙරට සමාජයට ලැබීම